# UNIVERSITY OF PERADENIYA
# පේරාදෙණිය විශ්වවිද්‍යාලය
## CENTER FOR DISTANCE & CONTINUING EDUCATION
## දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පරීක්ෂණය-2015

(2016 අගෝස්තු)

**ඉතිහාසය V (HG 5)**

**ක්‍රි.ව. 1500 සිට 1948 දක්වා ශ්‍රී ලංකාවේ ඉතිහාසය**

කාලය පැය තුන (03) යි.

යටත් පිරිසෙයින් **එක්** කොටසකින් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

සුදුසු තන්හි ඔබේ පිළිතුරු දළ සිතියම් මඟින් පහදන්න.

නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපා හරිනු ලැබේ.

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව දොළස (12) කි.

---

### පළමු වන කොටස

1. ශ්‍රී ලංකාවේ පෘතුගීසි බල ව්‍යාප්තියේ ප්‍රධාන අදියර විභාග කරන්න.
2. සීතාවක රාජ්‍යයේ උන්නතිය කෙරෙහි බලපෑ සාධක සාකච්ඡා කරන්න.
3. ශ්‍රී ලංකාවේ ලන්දේසීන්ගේ ආගමික ප්‍රතිපත්තිය පැහැදිලි කරන්න.

### දෙවන කොටස

4. උඩරට රාජධානියේ පරිපාලන ව්‍යුහයේ මූලික අංග ලක්ෂණ විග්‍රහ කරන්න.
5. දහනව වන සියවසේ අග භාගයේ ශ්‍රී ලාංකේය සමාජය කෙරෙහි අනගාරික ධර්මපාලගේ බලපෑම සාකච්ඡා කරන්න.
6. දහනව වන සියවසේ දෙවන භාගයේ පැවති පුනර්ජීවන ව්‍යාපාරයන්හි විවිධ ස්වරූප පැහැදිලි කරන්න.

## තුන් වන කොටස

7. විසිවන සියවසේ මුල් භාගයේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ධනය සාකච්ඡා කරන්න.

8. බ්‍රිතාන්‍ය පාලනය යටතේ වූ වතු ආර්ථිකයේ මූලික අංග ලක්ෂණ විශ්ලේෂණය කරන්න.

9. බ්‍රිතාන්‍යයන් විසින් ශ්‍රී ලංකාවට විධායක කාරක සභා ක්‍රමය හඳුන්වා දුන්නේ ඇයි?

## හතර වන කොටස

10. සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් රැකගැනීම සඳහා සෝල්බරි කොමිසම ඉදිරිපත් කර ඇති නිර්දේශ කවරේද?

11. ඩී.එස්. සේනානායකගේ ඓතිහාසික භූමිකාව අගයන්න.

12. පහත දැක්වෙන මාතෘකා අතුරින් ඕනෑම <u>දෙකක්</u> පිළිබඳව ඓතිහාසික සටහන් ලියන්න.

(අ) පේරනිමෝ ද අසවේදු

(ආ) VOC සමාගම

(ඇ) 1915 සිංහල-මුස්ලිම් කෝලාහලය

(ඈ) 1936 සර්ව සිංහල අමාත්‍ය මණ්ඩලය